කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

සිංහල භාෂාව හා සාහිත්‍යය
(I කොටස )

08 වන ශ්‍රේණිය

විනාඩි 30
Thirty minutes

නම/ විභාග අංකය .........................................................

- ❋ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- ❋ මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 40කි.
- ❋ I පත්‍රයට පිළිතුරු සපයා අවසානයේ II පත්‍රයේ පිළිතුරු පත්‍රය සමඟ එකට අමුණා භාර දෙන්න.

---

- **පහත දැක්වෙන වාක්‍යයන්හි ඉරි ඇඳි පදවලට වඩාත් උචිත යෙදුම වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) තම සතුරාට අත් වූ විපත ඇසූ ඔහු කිඹුල් කඳුළු සැලුවේය.
(කිඹුලකු සේ හැඬීම, බොරුවට හැඬීම, හඬනගා හැඬීම, සතුට ප්‍රකාශ කිරීම)

(02) "දැන් මිනිහගෙ කරල පැහිලා" සේතන් මාමා උජාරු ගමනින් යන ගුණපාල දෙස බලා කීවේය.
(වගාව සරුවෙලා, වයසට ගිහින්, දියුණුවට පත්වෙලා, අමාරුවට පත්වෙලා)

(03) නිතරම අනුන්ගේ වංහුං සෙවීම ඔහුගේ පුරුද්දකි.
(තොරතුරු, කරදර, අසනීප, ආ ගිය තැන්)

- **පහත වාක්‍යයෙහි එන පූර්ව ක්‍රියා පදයක් හා මිශ්‍ර ක්‍රියා පදයක් උපුටා ලියන්න.**

බල්ලා බුරමින් වැට දෙසට එනවිට ළමයා දුවගොස් ගසට නැංගේය.

(04) පූර්ව ක්‍රියාව .........................................................................

(05) මිශ්‍ර ක්‍රියාව .........................................................................

- **පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.**

(06) කපන්න බැරි අත .........................................................................

(07) කපුටු පිහාටුව කපුටො .........................................................................

- **පහත වචන පේළියෙහි මුලින් දී ඇති පදයට බහු අර්ථ පදයක් නොවන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

(08) දිය - ලෝකය, අපාය, ජලය, දිනුම

- **පහත වචන පේළිවල අක්ෂර වින්‍යාසය නිවරදිව දක්වා ඇති වචනය තෝරා තිත් ඉර මත ලියන්න.**

(09) කොට්ඨාශය, කොට්ඨාසය, කොඨීටාසය, කොට්ඨාෂය

.....................................................................................................................

(10) ප්‍රවේශම් වීම, ප්‍රවේෂම් වීම, ප්‍රවේසම් වීම, ප්‍රවේසං වීම.

.....................................................................................................................

- **පහත දැක්වෙන වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.**

(11) අම්මා දරුවා නළවයි.

.....................................................................................................................

(12) ගුරුවරු සිසුන් යහමග

.....................................................................................................................

- **සුදුසු වර්තමාන කාල ආඛ්‍යාත පද යොදා පහත දැක්වෙන වාක්‍ය සම්පූර්ණ කරන්න.**

(13) දියණියෝ මව්පියනට උවටැන් ..............................................................

(14) ගුරුවරු සිසුන් යහමග ..............................................................

- **සුදුසු අතීත කාල ආඛ්‍යාත පද යොදා පහත දැක්වෙන වාක්‍ය සම්පූර්ණ කරන්න.**

(15) අම්මා දියණිය සමග නගරයට ..............................................................

(16) උපාසක උපාසිකාවෝ පන්සල් බිම පිරිසිදු ..............................................

- **පහත දැක්වෙන යුගලපද සම්පූර්ණ කරන්න.**

(17) බේත් ..............................................................

(18) .............................................................. ලොට්ට

- **පහත දැක්වෙන වචන ගොනුවලට ඡත්‍ර පද (තනි පද) ලියන්න.**

(19) කිසිම කාර්යයක් කඩිසරව කළ නොහැකි ..............................................

(20) තමා කළ වැරදි තමා විසින් ම කියා පෑම ..............................................

(ලකුණු - 40)

කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

සිංහල භාෂාව හා සාහිත්‍යය
(II කොටස )

08 වන ශ්‍රේණිය

පැය 1 යි විනාඩි 30
One hour & Thirty minutes

නම/ විභාග අංකය ..........................................................

- පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.
- දෙවන පත්‍රය සඳහා මුළු ලකුණු 60 කි.

---

**(01) ඔබ පංති කාමරයේදී සහභාගී වූ ව්‍යුහගත රචනා ලිවීම පිළිබඳ කණ්ඩායම් ක්‍රියාකාරකම ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

(i) ඔබ අයත් වූ කණ්ඩායම සාකාච්ඡා කළ රචනා මාතෘකාව කුමක්ද?

(ii) කණ්ඩායම තුළ රචනා සාකච්ඡා කිරීමේදී මතු වූ ගැටලු දෙකක් ලියන්න.

(iii) රචනා ලිවීම සම්බන්ධව ගුරුතුමා හෝ ගුරුතුමිය ගෙන් ලද උපදෙස් දෙකක් ලියන්න.

(iv) වැඩිම ලකුණු ලැබුණු රචනාවේ ඔබ දුටු ප්‍රබලතා දෙකක් ලියන්න.

(v) මෙම කණ්ඩායම් ක්‍රියාකාරකමින් ඔබ ලබා ගත් ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ලකුණු - 16)

(02) පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.

(i) සුරකිමු හෙළ බස පණ මෙන් ,

(ii) අපි මැණික් පතලක් නරඹන්නට ගියෙමු ,

(iii) ජලය සුරැකිය යුතු සම්පතකි ,

(iv) පොත්පත් කියවමු ලෝකය ජයගමු ,

(v) පරිගණකයෙන් ළමා ඉගෙනුමට ඇතිවන බලපෑම , (ලකුණු - 11)

(03) ඔබේ පාසල අසල මහා මාර්ගයෙහි නිතිපතා එක්රැස් වන විශාල කුණු කසළ ගොඩක් ඇතැයි සිතන්න. එය පාසල් දරුවන්ගේ සෞඛ්‍යයටද බලවත් තර්ජනයකි. මේ කසළ ගොඩ හැකි ඉක්මනින් මෙම ස්ථානයෙන් ඉවත් කර දෙන මෙන් ඉල්ලා ඔබේ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලේකම්තුමා වෙත යැවීමට සුදුසු ලිපියක් ලියන්න.

(ලකුණු - 11)

- පහත දැක්වෙන 4, 5, 6 ප්‍රශ්නවලට අයත් ගද්‍ය පද්‍ය කොටස් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(04) "ඔන් එහෙම අකුරු කරපු කෙනෙක් දැන් කොහෙද ඒජන්ත හාමුදුරුවොලූ"

(i) මේ කියමන උපුටා ගත් කෙටි කතාවෙහි රචිකාව නම් කරන්න.

(ii) මෙම කෙටි කතාව උපුටාගත් පොත නම් කරන්න.

(iii) මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන් විසින්ද?

(iv) මෙම ප්‍රකාශයට සවන් දෙන්නේ කවුරුන්ද?

(v) ප්‍රකාශයට සවන් දෙන අය යමින් සිටිනුයේ කොහේද? (ලකුණු - 11)

(05)

මන්ත්‍ර මායා ජප කරන්නිය
සක්වලින් මාරුත ගෙනෙන්නිය
භූත වෙස් ගෙන සැරිසරන්නිය
සයුරු නැව් ගිල්වා
මුහුදු දිය කලඹා

(i) මේ සඳහන් කරනුයේ කවුරුන් ගැනද?

(ii) මේ සඳහන් කරන අයගේ දරු දෙදෙනාගේ නම් ලියන්න.

(iii) මෙම නාට්‍ය රචනා කළ අය නම් කරන්න.

(iv) දරු දෙදෙනා හැරුණු කොට නාට්‍යයේ මෙම කොටසේ සිටි අනෙක් චරිතය නම් කරන්න.

(v) මාරුත, ජප කරනවා යන වචනවලට සරල තේරුම් ලියන්න.

(ලකුණු - 11)

(06) "ගෙනෙව කුඩාවරුනි මඤ් පොහොසත්මි"

(i) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දක්ද?

(ii) මෙසේ ගෙනෙන්නට කියන්නේ කුමක්ද?

(iii) මේ ගෙනෙන්නට කියන දෙය කවර නම් රජකු විසින් එවන ලද්දක්ද?

(iv) මේ කතාව උපුටා ගත් පොත නම් කරන්න.

(v) "කුඩාවරුනි" යනු කවුරුන්ද?

(ලකුණු - 11)

(07) පහත දැක්වෙන කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගස අගනා
අර රදනා
මලට මනා
බොහොම හිනා

නැණ ගුණ දම්
රුව පැහැතුම්
ඇති අයනම්
රෝස කුසුම්

ගස වතුසුදු
වී පිරිසිදු
පොහොය නැතිදු
සිල් ගත් බඳු

මහ පුදුමෙකි
මලෙක මලෙකි
නැහැ එහි සකි
සමනලයෙකි

(i) මෙම කවි පන්තියෙහි එක උපමාවක් තෝරා ලියන්න.

(ii) පහත වචනවලට සරල තේරුම් ලියන්න. සකි, නැණ

(iii) මලෙක මලෙකි යන්නෙන් කුමක් අදහස් කෙරේද?

(iv) රෝස කුසුම් වන්නේ කවර ආකාර අයද?

(v) මෙහි කියවෙන මල් වර්ග දෙකක නම් ලියන්න. (ලකුණු - 11)